## වීරකැටිය ප්‍රාදේශීය සභාව
## මාසික සභා රැස්වීම - 2023 ජනවාරි 17

වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 17 වන දින පෙරවරු 10.00 ට වීරකැටිය ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදී පැවති 06 වැනි සැසි වාරයේ 58 වැනි මාසික සභා රැස්වීමේ ලුහුඩු වාර්තාවයි.

පැමිණීම :-

1. පියසේන ලියනආරච්චි - ගරු සභාපති
2. වරාහේන ලියනගේ අනුර ද අල්විස් - ගරු උප සභාපති
3. ගුණතිලක ජයසේකර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
4. මුණසිංහ ලියනආරච්චිගේ රංජිත් - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
5. රණවීර ආරච්චිගේ ආරියරත්න - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
6. දහනායක සේපාල - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
7. බැදිගම කපුගේ චන්ද්‍රසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
8. විජමුණිගේ රණතුංග - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
9. චමින් ක්‍රිෂාන්ත කුමාර ලියනආරච්චිගේ - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
10. රණවීර ගමගේ සෝමාවතී - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
11. ජයවික්‍රම ආරච්චිගේ සන්ධ්‍යා ශ්‍රියානි - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
12. මුණසිංහ ආරච්චිගේ ශ්‍රියාණි - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
13. විජමුනි දූරගේ රත්නපාල - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
14. කොඩිකාරගේ වත්සලා මධුෂානි කොඩිකාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
15. මනතුංගේ ගුණරත්න - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
16. පල්ලිය ගුරුගෙයි දොන් ලක්ෂ්මන් චන්ද්‍රරත්න අබෙවර්ධන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
17. ලියනආරච්චිගේ චන්ද්‍රදාස - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
18. හේවා ගම්මැද්දගේ ඉන්දික කුමාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
19. රාමනායකගේ අරුණසිරි - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
20. නානායක්කාර වසන් අප්පුගේ ගීතිකා කවුන්දරී හේමාලි - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
21. ලියන ආරච්චිගේ නාලක හේමන්ත - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
22. දෙවුන්දර සිත්තර බඩල්ගේ විපුලසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
23. හේවාගමගේ සුරංග පුෂ්පකුමාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
24. පද්මල් රුබසිංහ - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
25. ලියනපතිරණගේ සිරිසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
26. චමල් ප්‍රදීප් කුමාර හෙට්ටිආරච්චි - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
27. කලංචිගේ රංජිත් මුණතුංග - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
28. විජමුනිගේ දර්ශන සම්පත් කුමාර - ගරු ප්‍රා.ස. මන්ත්‍රී

නොපැමිණීම :-

29. ආයිත්තප්පුලිගේ චාමර මිහිරංග - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
30. දඩල්ලගේ දයාවති - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
31. කංකානම්ගේ මිලාන් මධුවන්ත - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
32. ගමගේ සරත් කුමාර සිරි - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
33. වැටිය විදානගමගේ චම්පා නිල්මිණී - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
34. ජයසිං බෝල්ප ගමගේ චාමිකා ක්‍රිෂාන්ති - ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
35. නිමල් දොන් ප්‍රැන්සිස්කු - ගරු ප්‍රා.ස. මන්ත්‍රී
36. මැදගසිංහගේ සුමනසේන - ගරු ප්‍රා.ස. මන්ත්‍රී

මූලාසනය :- ගරු සභාපති පියසේන ලියනආරච්චි මහතා

අද දින සභා රැස්වීම සඳහා විරකැටිය ප්‍රාදේශිය සභාවේ ලේකම් ජී.ඒ. නදීකා දිල්හානි මහත්මිය සහභාගී විය.

**පිළිගැනීම :-**

ගරු සභාපති පියසේන ලියනආරච්චි මහතා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්යාලයේ නිලධාරී මණ්ඩලය සහ මාධ්‍යවේදී මහතා ඇතුළු සියලු දෙනාම ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගන්නා ලදී.

**ආගම සිහිකිරීම :-**

සියලු දෙනාම තිසරණ සහිත පංචශීලය සමාදන් විය.

**ජාතික ගීය ගායනා කිරීම :-**

සියලු දෙනාම එක්ව ජාතික ගීය ගායනා කරන ලදී.

**රට ජාතිය වෙනුවෙන් කැපවුනු සියලු විරුවන් වෙනුවෙන් විනාඩි 2 ක නිශ්ශබ්දතාවය රැකීම :-**

රැස්ව සිටි පිරිස විනාඩි 02 ක නිශ්ශබ්දතාවය පළ කරන ලදී.

**නිවාඩු අනුමත කිරීම :-**

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ආයින්තප්පුලිගේ චාමර මිහිරංග මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී දඩල්ලගේ දයාවති මහත්මිය, ගරු ප්‍රා.ස. මන්ත්‍රී කංකානම්ගේ මිලාන් මධුවන්ත මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගමගේ සරත් කුමාර සිරි මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී වැටිය විදානගමගේ චම්පා නිල්මිණී මහත්මිය, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජයසිංහ බෝල්ප ගමගේ චාමිකා ක්‍රිෂාන්ති මහත්මිය, ගරු ප්‍රා.ස. මන්ත්‍රී නිමල් ප්‍රැන්සිස්කු මහතා සහ ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්. සුමනසේන මහතා අද දින සභාවට නොපැමිණෙන බව මා වෙත වාර්තා කර ඇති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

ඒ අනුව එම මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමිත් ලියනආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**01. පසුගිය රැස්වීමේ වාර්තාව අනුමත කිරීම :-**

පසුගිය මාසික සභා රැස්වීමේ න්‍යාය පත්‍රයත් සමග සභා වාර්තාව සියලු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්නට සලස්වා ඇති බැවින්, කියවා සංශෝධන ඇතොත් එම සංශෝධන ඉදිරිපත් කරන ලෙසත්, එසේ සංශෝධන නොමැති නම් සංශෝධන නොමැති සේ සලකා සභා සම්මත කරන ලෙසත්, ගරු සභාපතිතුමා විසින් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව පසුගිය මාසික සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.එම්. රණතුංග මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**02. මූලාසනයේ විශේෂ නිවේදන :-**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ වසර 05 ක කාලයක් සභාවක් වශයෙන් එකට සේවය කරන ලද බවයි. මේ වන විට මැතිවරණය සඳහා සියලු පක්ෂ ඇප මුදල් තැන්පත් කර ඇත. මෙම කාල සීමාව තුළ තම තමන්ගේ කොට්ඨාශ වල සංවර්ධන කටයුතු සිදුකරමින්, සභාව තුළ විවිධ මතිමතාන්තර සමග සභාවේ කටයුතු කරගෙන යන ලද අතර, කෙසේ වුවද සියලුම මන්ත්‍රීතුමන්ලා ඉතා සහයෝගයෙන් කටයුතු කරන ලදී. ඒ පිළිබඳව සියලුම මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය පුදකරන ලදී. එසේම කාර්ය මණ්ඩලයටද ලබාදුන් සහයෝගයට ස්තූතිය පුදකරන ලදී. මා විසින් සභාව භාරගන්නා විට සභාවේ ගිණුමේ ඉතා සුළු මුදලක් තිබූ අතර, එම මුදල වැඩි කරගනිමින් මහජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කිසිදු දේශපාලන භේදයකින් තොරව සභාවක් වශයෙන් 75% ක පමණ සංවර්ධන කටයුතු සිදුකරන ලදී. සභාවේ දේපල අත්සතු වීමට ඉඩ නොදී මහජනතාවගේ දේපලක් වශයෙන් ආරක්ෂා කරන ලදී. මහජනතාවට සේවය කිරීමට අප හට ලබාදුන් බලය ජනතාවගේ පොදු යහපත වෙනුවෙන් ඉටුකරන ලද බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් පවසන ලදී.

03. සංදේශ, පෙත්සම්, පැමිණිලි සහ ආයාචනා සභාගත කිරීම :-

03.1 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් එවා ඇති කෙටි කාලීන පාඨමාලා සඳහා ආධුනිකයන් බඳවා ගැනීම සම්බන්ධ ලිපිය සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

04. කාරක සභා වාර්තා :-

4.1 මුදල් කමිටුව :

2022.12.30 දින පැවති මුදල් කමිටු වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. මුදල් කමිටු වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.පී. සුරංග පුෂ්පකුමාර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

4.2 කාර්මාන්ත කමිටුව : නැත

4.3 සංවර්ධන හා උපදේශන කමිටුව : නැත

4.4 පරිසර කමිටුව : නැත

4.5 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව : නැත

05. සභාවේ ආදායම් සහ වියදම් වාර්තා සහ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම :-

<u>ඒකාබද්ධ වැය සාරාංශය - 2022 නොවැම්බර් මාසය</u>

| | |
|---|---|
| වැටුප් හා දීමනා | 5596232.24 |
| ගමන් වියදම් | 142704.00 |
| සැපයුම් හා උපකරණ | 2207569.00 |
| ප්‍රාග්ධන වත්කම් අ.වැ.හා නඩත්තුව | 891252.50 |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක සේවා | 293978.78 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 49145.45 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 29390.00 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 58842.53 |
| පුනරාවර්තන වියදම්වල එකතුව | 9269114.50 |
| ප්‍රාග්ධන වැය | 4356767.00 |
| ණය ආපසු ගෙවීම් | 188457.46 |
| ප්‍රාග්ධන වැය එකතුව | 4545224.46 |
| **මාසයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් එකතුව** | **13814338.96** |
| විවිධ ණය හිමියෝ | 15837862.00 |
| අත්තිකාරම් | 98200.00 |
| තැන්පත් | 147420.00 |
| සේවක ණය | 1250000.00 |
| ණය ගැති | - |
| අතිරික්ත/ඌණතා/වෙනත් (ගිණුම් අතර මුදල් මාරු) | - |
| **මාසයේ මුළු ගෙවීම් එකතුව** | **31147820.96** |

<u>ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2022 නොවැම්බර් මාසය</u>

| | |
|---|---|
| වරිපනම් හා බදු | 190398.59 |
| කුලී | 1512517.83 |
| බලපත්‍ර ගාස්තු | 163430.00 |
| සේවා සඳහා ගාස්තු | 312138.00 |
| වරෙන්තු ගාස්තු | 761571.99 |
| වෙනත් ආදායම් | 1610366.04 |
| වෙනත් ආධාර | 4684939.37 |
| පුනරාවර්තන ආදායම් එකතුව | 9235361.82 |
| මූලධන ලැබීම් | - |

| | |
|---|---:|
| පුනරාවර්තන හා ප්‍රා. ආදායම්වල මුළු එකතුව | **9235361.82** |
| සේවක ණය | 484383.52 |
| තැන්පත් | 862485.25 |
| අත්තිකාරම් | 11018.00 |
| විවිධ ණය ගැති | 39620702.94 |
| ආදායම් හා වෙනත් ලැබීම් (විවිධ ණයගැති) | 36642.75 |
| **මුළු එකතුව** | **50250594.28** |

ලැබීම් සහ ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ සහ හිඟ ආදායම් විස්තර සත්‍ය විස්තර ඇතුලත් වාර්තා සත්‍ය වාර්තා වන බැවින්, එම වාර්තා සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී සේපාල දහනායක මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.ඩී. රත්නපාල මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**06.** කල් දෙනු ලැබූ ප්‍රශ්න :- නැත

**07.** කල් දෙනු ලැබූ යෝජනා :-

07.1 ආදාහනාගාරය සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. ආදාහනාගාරයේ ආදාහනයක් සඳහා දින වෙන්කිරීමේදී කාලය ප.ව. 2.00, ප.ව. 4.00 සහ ප.ව. 6.00 ලෙස වෙන්කර ඇත. මෘත දේහ ආදාහනය සඳහා මුදල් ගෙවා අදාල වේලාව වෙන් කරගත්තද එදින මෘත දේහය ආදාහනයට රැගෙන නොඑන අවස්ථා ඇත. ඉන්පසුව සභාවට ගෙවන ලද මුදල් නැවත ඔවුන් වෙත ගෙවීමට ද සිදුවී ඇත. එහිදී නිවාඩු දිනයක් වුවහොත් එම දිනය සඳහා ආදාහනාගාරයේ සේවය කිරීමට දෙදෙනෙකු යෙදවීමටත්, එම සේවකයන් සඳහා අතිකාල දීමනා ගෙවීමටත් සිදුවේ. එහිදී සභාවට විශාල පාඩුවක් සිදුවන නිසා එම පාඩුව අවම කරගැනීම සඳහා තීරණයක් ගත යුතුය.

ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් පවසා සිටියේ ආදාහනයක් සිදුකිරීම අවලංගු කිරීමේදී තැන්පත් කරන ලද මුදලින් භාගයක් සභාවට අයකරගැනීම සුදුසු බවයි. "ආදාහනයක් සිදුකිරීම අවලංගු කිරීමේදී තැන්පත් කරන ලද මුදලින් භාගයක් සභාවට අයකරගන්නා බව" මුදල් අයකිරීමේදී ලබාදෙන ලදුපතෙහි සටහන් කරන ලෙස වැඩිදුරටත් පවසන ලදී.

තැන්පත් කරන ලද මුදලින් අඩක් රඳවා ගැනීම සාධාරණ නොවන බව ගරු ප්‍රා.ස. මන්ත්‍රී චන්ද්‍රදාස ලියනආරච්චි මහතාගේ අදහස විය.

ආදාහනයක් සිදුකිරීම අවලංගු කිරීමේදී තැන්පත් කරන ලද මුදලින් 1/3 ක මුදලක් රඳවාගැනීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.2 2022 වර්ෂයේ පොදු වෙළඳපොළ හා රථවාහන පොළ සඳහා සහන සැලසීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. 2022 වර්ෂයේ මැයි මස සිට රට තුළ පැවති අර්බුදකාරී තත්වය හා පොහොර, ඉන්ධන අර්බුදය හේතුවෙන් වකුව පොළ බදුකරුවන්ට බදු වාරික ගෙවා ගැනීමට අපහසු බැවින්, සහන ලබාදෙන ලෙස ඉල්ලීම් කර තිබූ අතර, එහිදී 2022 මැයි මස සිට ඔක්තෝම්බර් මස දක්වා පොදු වෙළඳපොළ සහ 2022 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා රථවාහන පොළ සඳහා පහත පරිදි සහන ලබාදීමට සුදුසු බවට සභාව තීරණය කර තිබුණි.

| | | | |
|---|---|---|---:|
| 1. | වීරකැටිය පොදු වෙළඳපොළ | - | 1283167.06 |
| 2. | තමාරයාය පොදු වෙළඳපොළ | - | 252000.82 |
| 3. | වලස්මුල්ල පොදු වෙළඳපොළ | - | 1056110.82 |
| 4. | වීරකැටිය රථවාහන නැවතුම්පොළ | - | 70350.00 |
| 5. | වලස්මුල්ල රථවාහන පොළ | - | 108039.99 |
| | මුළු මුදල | - | **2769668.39** |

ඒ අනුව 2022 මැයි මස සිට ඔක්තෝම්බර් මස දක්වා පොදු වෙළඳපොළ හා මැයි මස සිට දෙසැම්බර් මස දක්වා රථවාහන පොළ සඳහා වන රු. 2769668.39 ක මුදල 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව කපාහැරීම සඳහා ගරු ආණ්ඩුකාර අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.3 රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් එවා ඇති කඩ කාමර සඳහා නව තක්සේරුවක් ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. වීරකැටිය ප්‍රාදේශීය සභාවට අයත් වීරකැටිය සති පොළ අසල පිහිටි අංක 01 සිට 09 දක්වා කඩ කාමර සඳහා මාසික වෙළඳපොළ කුලිය පහත පරිදි තක්සේරු කර වාර්තා කර ඇත.

| කඩ කාමර අංකය | මාසික වෙළඳපොළ කුලිය |
|---|---|
| අංක 01 | 8100.00 |
| අංක 02 | 6000.00 |
| අංක 03 | 6000.00 |
| අංක 04 | 6000.00 |
| අංක 05 | 6000.00 |
| අංක 06 | 6000.00 |
| අංක 07 | 6000.00 |
| අංක 08 | 6000.00 |
| අංක 09 | 7800.00 |

ඒ අනුව ඉහත සඳහන් ආකාරයට වීරකැටිය ප්‍රාදේශීය සභාවට අයත් වීරකැටිය සති පොළ අසල පිහිටි අංක 01 සිට 09 දක්වා කඩ කාමර නව තක්සේරු මුදල 2023 ජනවාරි මස සිට අයකිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. සුරංග පුෂ්පකුමාර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.4 වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එවා ඇති වලස්මුල්ල ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය පවරා ගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. එම ලිපිය මගින් ඉඩම් හුවමාරු ක්‍රමවේදය යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලද හොත් ජුලම්පිටිය සමෘද්ධි බැංකුවට යාබදව පිහිටි රජයේ බිම් කොටස, පහළඹබඩ පිහිටි රජයේ බිම් කොටස සහ මුරුතවෙල මහා විද්‍යාලයට යාබදව පිහිටි රජයේ බිම් කොටස යන බිම් කොටස් වලින් එක් කොටසක් ලබාදිය හැකි බවට දන්වා ඇත.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ වලස්මුල්ල නගරය දියුණු වෙමින් පවතින නගරයක් බවත්, එහිදී එම ඉඩම ඉතාමත් වටිනාකමක් පවතින ඉඩමක් බවත්ය. මෙම ඉඩම් වල වටිනාකම වැඩි නිසා එක් එක් පුද්ගලයන් විසින් මෙම ඉඩම් අත්පත් කරගැනීමට උත්සාහ දරයි. නමුත් මා ඒ සඳහා අවස්ථාව ලබා දී නොමැත. ආනන්ද කුලරත්න මැතිතුමා විසින් දරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් එම ඉඩම් කොටස ලබා දෙන ලදී. ඒ තුලින් දරුවන් විශාල ප්‍රමාණයක් අධ්‍යාපනය ලබා ඇත. මෙම ඉඩමෙන් ඉවත් වන ලෙස කිසිදු විටක ආධුනිකත්ව මණ්ඩලයට අප විසින් පවසා නොමැත. නමුත්, ඔවුන් විසින් මෙම ඉඩම ඔවුන්ට පවරා දෙන ලෙස ඉල්ලා ඇත. මෙම ඉඩම ලබාදීමට සභාවට අයිතියක් නොමැති අතර, සමෘද්ධි අධිකාරියට ඉඩම් කොටස ලබාදුන් සේම මෙම ඉඩම ද පවරා දෙන ලෙස ඉල්ලා ඇත. එසේ ලබාදෙනවානම් නගරයෙන් ඉඩම් කොටසක් ලබාදෙන ලෙස මා විසින් ආධුනිකත්ව පුහුණු මණ්ඩලයට දන්වා යවන ලදී. එහිදී ලබාදිය හැකි ඉඩම් වල තොරතුරු ඉහත පරිදි ඉදිරිපත් කර ඇත. ගරු සභාපතිතුමා විසින් එයට විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

වලස්මුල්ල පොළ සඳහා පැවති ඉඩම පසුව හිඟණ සමයේදී හමුදාව විසින් භාවිතා කරන ලද අතර, ඉන්පසුව ආනන්ද කුලරත්න මැතිතුමා විසින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ආධුනිකත්ව පුහුණු මණ්ඩලයට ලබාදෙන ලද බව ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් පවසන ලදී. එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කරදෙන ලෙස වලස්මුල්ල වෙළඳ සංගමයෙන් ආධුනිකත්ව පුහුණු මණ්ඩලය ඉල්ලීමක් කර ඇත. එහිදී ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය යොදා සකස් කරදීමට වෙළඳ සංගමය ඉදිරිපත් වී ඇත. දරුවන් සඳහා මෙවැනි ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානයක් වලස්මුල්ල නගරයේ පැවතිය යුතුය. නමුත්, එම ඉඩම ලබාදීම ගැටලුවකි. වලස්මුල්ල වෙනත් සභාවක් ලෙස සකස් වුවහොත් දැනට පවතින වලස්මුල්ල උප කාර්යාලීය භූමිය ඉඩකඩ පහසුකම් අවම නිසා නව ගොඩනැගිල්ලක් සකස් කිරීමට අවශ්‍ය වුවහොත් එම ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම යොදා ගත හැකිය. එම නිසා වලස්මුල්ල මහජන ක්‍රීඩාංගනයේ පිටුපස කොටස බදු පදනම මත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ලක්ෂ්මන් පල්ලියගුරු මහතාගේ ද අදහස වූයේ රජයේ ආයතන නිසා බදු පදනමක් නොමැතිව හෝ වලස්මුල්ල මහජන ක්‍රීඩාංගනය පිටුපස ඉඩම් කොටස ලබාදීම සුදුසු බවයි.

වලස්මුල්ල මහජන ක්‍රීඩාංගනයේ පිටුපස කොටස බදු පදනම මත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07.5 RS-1626 බැක්හෝ යන්ත්‍රය අලුත්වැඩියාව සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. බැක්හෝ යන්ත්‍රයේ ඉදිරිපස ටයර් දෙක අලුතින් යෙදිය යුතුය.

ඒ අනුව RS-1626 බැක්හෝ යන්ත්‍රය සඳහා ඉදිරිපස ටයර් සඳහා මිල කැඳවීම සිදුකර සුදුසු ආයතනයක් තෝරාගෙන ටයර් මිලදී ගැනීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී අරුණසිරි රාමනායක මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.6 මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීම සහ වීථි පහන් කණු අංක කිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. වීරකැටිය ප්‍රාදේශිය සභාව සතු මාර්ග සහ වීථි පහන් කණු අංක කිරීම සඳහා බල ප්‍රදේශය පුරා සමීක්ෂණ කටයුතු සිදුකිරීම ඇති බවත්, එහිදී යතුරුපැදි 02 ක් සහ ජංගම දුරකථන 02 ක් යොදාගත යුතු බව එම ලිපිය මගින් දන්වා ඇත. යතුරුපැදි 02 සඳහා ඉන්ධන සහ ක්ෂය වියදම් වශයෙන් එක් යතුරුපැදියක් වෙනුවෙන් එක් කිලෝමීටරයක් සඳහා රු. 50/- ක මුදලක් ද, ජංගම දුරකථන 01 ක් සඳහා දිනකට ඩේටා රු. 500/- ක මුදලක් ද ලබාදීම සුදුසු බවට තාක්ෂණ නිලධාරී මහතා විසින් දන්වා ඇත.

එක් යතුරුපැදියකට ඉන්ධන සඳහා එක් කිලෝමීටරයකට රු. 25/- ක මුදලක් ද, ජංගම දුරකථන 01 ක් සඳහා ඩේටා පැකේජයක් ලබාදීමත් සුදුසු බව ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතාගේ අදහස විය.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ලක්ෂ්මන් පල්ලියගුරු මහතා විසින් පවසා සිටියේ වාහන වල ක්ෂය වීමත් සමග 25/- ක මුදලක් එක් කිලෝමීටරයකට ලබාදීම ප්‍රමාණවත් නොවන බවත්, තාක්ෂණ නිලධාරී මහතාගේ අධීක්ෂණය මත කටයුතු කිරීම සුදුසු බවත්ය.

ඒ අනුව යතුරුපැදි 01 ක් සඳහා ඉන්ධන සහ ක්ෂය වියදම් වශයෙන් රු. 30/- ක මුදලක් ලබාදීමත්, දිනකට වැයවන ඩේටා සඳහා අදාළ මුදල් ලබාදීමත් සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී අරුණසිරි රාමනායක මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.7 සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට දායක මුදල් ගෙවීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. 2013 වර්ෂයේ ඔක්තෝම්බර් මස සිට 2022 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ආදේශක / අනියම් / කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතුව සිටි සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල රු. 1,246,676.79 ක් ලෙස සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් 2023.01.11 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇත.

ඒ අනුව 2013 වර්ෂයේ ඔක්තෝම්බර් මස සිට 2022 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ආදේශක / අනියම් / කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතුව සිටි සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල වන රු. 1,246,676.79 ක මුදල එකවර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ගෙවීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.8 LL-7664 කෘෂ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. 2014 වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් පරිත්‍යාගයක් ලෙස ලබාදුන් LL-7664 කෘෂ කැබ් රථයට හිමි ලියාපදිංචි සහතිකය වීරකැටිය ප්‍රාදේශිය සභාව නමින් පවරා ගැනීමට මේ වන තෙක් නොහැකි වී ඇත. එයට හේතුව නම් ප්‍රධාන අමාත්‍යාංශය විසින් වැරදීමකින් ඉහත වාහනයේ චැසි අංකයට හිමි ලියාපදිංචි සහතිකය තින්දවුර් ප්‍රාදේශිය සභාව නමින් ලියාපදිංචි කර තිබීමයි. තින්දවුර් ප්‍රාදේශිය සභාව වෙත ලබාදී ඇති අපගේ කෘෂ කැබ් රථයට හිමි ලියාපදිංචි සහතිකය නැවත අප ආයතනය නමින් ලියාපදිංචි කරගැනීම සඳහා අදාල ලිපිලේඛන සකස් කර ඇති අතර, නමුත් එහිදී වාහනයට අදාල පවරා ගැනීම සිදුකිරීමේදී ඊට අදාල වලංගු ආදායම් බලපත්‍රය අප විසින් ලබාදිය යුතුය. මෙතෙක් එහි ආදායම් බලපත්‍රය ලබාගෙන නොමැති බැවින්, වසර පහකට වැඩි කාලයක සිට බලපත්‍ර ගාස්තු සඳහා අදාල ගෙවීම සිදුකළ යුතුය.

ඒ අනුව LL-7664 කෘෂ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබාගැනීමේදී ඊට අදාල බලපත්‍ර ගාස්තු ගෙවීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.9 වීරකැටිය ප්‍රදේශිය සභා බල ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා සිලින්ඩර් යෙදීමට සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මැතිවරණ කාල සීමාව තුළ මිලදී ගැනීම සිදු නොකරන ලෙස ගරු ප්‍රා.ස. මන්ත්‍රී ලක්ෂ්මන් පල්ලියගුරු මහතා විසින් ප්‍රකාශ කරන ලදී. එසේම මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමට පෙර බල ප්‍රදේශයේ දරුවන් සඳහා පොත් සහ පොත් බෑග් ලබාදෙන ලෙසත් වැඩිදුරටත් පවසන ලදී. එසේ නොකළහොත් එය සභාවට අගෞරවයකි.

ආණ්ඩුකාරතුමා විසින් බල ප්‍රදේශයේ දරුවන් සඳහා පොත් සහ පොත් බෑග් ලබාදීම සම්බන්ධව කරන ලද යෝජනාව අනුමත කර ඇති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා අදහස් දක්වමින් පවසා සිටියේ මැතිවරණ කාලයේදී මෙම කාර්යයන් සිදුකළ ද පක්ෂ භේදයකින් තොරව පොදුවේ සියලුම දරුවන් හට ලබාදෙන බවයි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතාගේ ද අදහස වූයේ මෙය රැකියා ලබාදීමවත්, උසස් වීම් ලබාදීමවත් වැනි කාර්යයක් නොවන නිසා පොදු කටයුත්තක් බැවින්, එම කාර්යය සිදුකිරීම සුදුසු බවයි. සභාව විසුරුවා හැරියද සභාවේ නිලධාරීන්ට එම කාර්යයන් සිදුකළ හැකිය. මැතිවරණයක් පැවතියද ග්‍රාමීය පොදු පහසුකම් කටයුතු සඳහා ඉදිරිපත් වී කටයුතු කරන ලෙසත්, ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන බවත් ගරු සභාපතිතුමාට පවසන ලදී.

වීරකැටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා සිලින්ඩර් යෙදීම සුදුසු බවට කරන ලද යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07.10 වීරකැටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්‍රිය වී ඇති විදි ලාම්පු සඳහා අලුතින් විදි ලාම්පු යෙදීම සඳහා විදි ලාම්පු 450 ක් මිලදී ගැනීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.11 ගරු ප්‍රා.ස. මන්ත්‍රී අරුණසිරි රාමනායක මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉහල ගෝනදෙනිය ඇල බන්ට් එකේ දෙවැනි ඇල කණ්ඩියේ පාලම අබලන්වීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. ඇල කණ්ඩියේ පාලම අබලන් වීම නිසා එම ප්‍රදේශයේ ජනතාව විශාල අපහසුතාවයකට පත්ව ඇත. පසුගිය දිනයකදී තාක්ෂණ නිලධාරී මහතා විසින් එම ස්ථානය පරීක්ෂා කරන ලද අතර, එහිදී තීරණය වූයේ සභාවේ මුදල් සහ කාර්ය මණ්ඩලය යොදවා ශ්‍රමදානයක් ලෙස මෙම කාර්යය කිරීම සුදුසු බවයි. නමුත් එම කාර්යය සිදු නොවුණි. ඒ සඳහා ගම්වාසීන් විසින් ශ්‍රම දායකත්වය ලබාදීමට ද එකඟතාවය ඇත. එම නිසා මේ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

ඒ සඳහා ගම්වාසීන් ශ්‍රම දායකත්වය ලබාදීමට හෝ ඉදිරිපත් නොවූ බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

ඒ අනුව ඉහල ගෝනදෙනිය ඇල බන්ට් එකේ දෙවැනි ඇල කණ්ඩියේ පාලම අලුත්වැඩියා කිරීමට සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

07.12 ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති පෙර පාසලක් සතු ඔන්චිල්ලාවක් ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. වීරකැටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ඕමාර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ වසා ඇති පෙර පාසලක තිබෙන අබලන් වී ඇති ඔන්චිල්ලාව ඊට යාබදව දැනට ක්‍රියාකාරීව පවත්වාගෙන යන ගලහිටිය උතුර ග්‍රාම නිලධාරී වසමේ පෙර පාසල සඳහා ලබාගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදෙන මෙන් ඉල්ලා ඇත.

ඒ අනුව ඕමාර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ වසා ඇති පෙර පාසලෙහි තිබෙන අබලන් වී ඇති ඔන්චිල්ලාව ගලහිටිය උතුර පෙර පාසල සඳහා ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. සුරංග පුෂ්පකුමාර මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.13 බල ප්‍රදේශයේ දරුවන් සඳහා පොත් සහ පෙර පාසල් දරුවන් සඳහා පොත් බෑග් ලබාදීම සඳහා අවශ්‍ය මිලදී ගැනීම සිදුකිරීමේදී අඩුම මිල ගණන් යටතේ මිලදී ගැනීම සිදුකිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

අඩුම මිල ගණන් පවතින ආයතනයකින් 2023 වර්ෂයට අලුතින් ලියාපදිංචි කර මිලදී ගැනීම සිදුකිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ මන්ත්‍රීවරුන් 04 දෙනා විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

අඩුම මිල ගණන් පවතින ස්ථානයකින් 2023 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා මිලදී ගැනීම සිදුකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව වැඩි ඡන්ද 24 කින් සභා සම්මත විය.

07.14 වීරකැටිය ප්‍රාදේශීය සභා පුස්තකාලයට සහ ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය පරිගණක ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. පුස්තකාල කටයුතු ස්වයංක්‍රීයකරණයට කොහා මෘදුකාංගය ස්ථාපනය කිරීම සඳහා සුදුසු පරිගණකයක් සහ කාර්යාලීය පරිහරණයට අවශ්‍ය පරිගණක ලබාගැනීම සඳහා එම ලිපිය මගින් අනුමැතිය ඉල්ලා ඇත.

ඒ අනුව වීරකැටිය ප්‍රාදේශීය සභා පුස්තකාලයට පුස්තකාල කටයුතු ස්වයංක්‍රීයකරණයට කොහා මෘදුකාංගය ස්ථාපනය කිරීම සඳහා සුදුසු පරිගණකයක් සහ කාර්යාලීය පරිහරණයට අවශ්‍ය පරිගණක හා අවශ්‍ය අනෙකුත් පහසුකම් 2023 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා මිලදී ගැනීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.15 වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් යොමු කර ඇති ග්‍රාම නිලධාරී කාර්යාලය පවත්වාගෙන යාම සඳහා වලස්මුල්ල මහජන ක්‍රීඩාංගනයේ ගොඩනැගිල්ලේ කාමරයක් ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. වලස්මුල්ල මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරයේ පවතින කාමරයක් වලස්මුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී, සමෘද්ධි නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා කාර්යාල කටයුතු පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස එම ලිපිය මගින් ඉල්ලා ඇත.

ඒ අනුව වීරකැටිය ප්‍රාදේශීය සභාවේ අවශ්‍යතාවය සඳහා අවශ්‍ය විටක ලබා ගැනීමේ එකඟතාවය මත ග්‍රාම නිලධාරී, සමෘද්ධි නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී කාර්යාල සඳහා ගෙවනු ලබන සම්මත මුදල අයකිරීමේ කොන්දේසිය සහිතව ගිවිසුම්ගතව ලබා දීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.16 උඩුකිරිවිල වැව ආශ්‍රිතව ක්‍රියාත්මක වන හංස බෝට්ටු සේවා ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා අයදුම්පත් ලබා දී ඇත්තේ එක් ව්‍යවසායකයකු සඳහා පමණි. මෙම සේවාව උඩුකිරිවිල වැව ආශ්‍රිතව ස්ථාපිත කිරීමේ අවස්ථාව වන විට මෙම ස්ථානයේ හංස බෝට්ටු සේවාවක් ආරම්භ කිරීම සඳහා මූලික අවශ්‍යතාවයන්ද සපුරා නොතිබූ තත්වයක් තුළ ස්ථානය සකස් කරගැනීම, ආරක්ෂිත උපකරණ සපයා ගැනීම හා සුදුසු වටපිටාවක් නිර්මාණය කරගැනීමේ කාර්යයන් වෙනුවෙන් විශාල පරිශ්‍රමයක් හා පිරිවැයක් දැරීමට මෙම ව්‍යවසායකයාට සිදු විය. එහිදී දැන්වීම් ප්‍රචාරණය හා ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන්ද තාවකාලික ජැටිය සකස් කිරීම, ආරක්ෂිත උපකරණ සපයා ගැනීම ආදී කාර්යයන් කර ගැනීමට ඔහුට සිදු විය. ඒ වෙනුවෙන් ඔහු විසින් තාවකාලික ජැටිය ඉදි කිරීමේදී ප්ලාස්ටික් බැරල්, ලෑලි, යකඩ ඇණ, බාස්කුලී සඳහා රු. 35000.00 ක් ද, ආරක්ෂිත උපකරණ සඳහා රු. 32450.00 ක් ද, හංස බෝට්ටු 02 ක් සහ මෝටර් බෝට්ටු 01 ක් සඳහා රු. 1250000.00 ක් ද වශයෙන් රු. 1317450.00 ක මුදලක් වැය වූ බව ඉදිරිපත් කර ඇත. එබැවින් මෙම හංස බෝට්ටු සේවාව ආරම්භ කර පවත්වාගැනීමේ කාර්යය වෙනුවෙන් සුවිශේෂී පරිශ්‍රමයක් දැරීමත් වියදම් වූ මුදල දරන ලද පිරිවැයට සාපේක්ෂව ප්‍රතිලාභ ලැබීමේ අවිනිශ්චිතතාවයක් පැවතීමත් හේතුවෙන් මෙම කාර්යයෙහිලා සැලකිය යුතු කාලයක් සේවාව පවත්වාගෙන යාමට ඉඩ හැරීම සුදුසුය.

එසේම මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී උඩුකිරිවිල වැවේ ජලජ ශාක ඉවත් කිරීමේ කාර්ය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් වීඩර් හාර්වස්ට් යන්ත්‍රය ලබා දෙන ලද අතර, ඒ සඳහා ඩීසල් ලීටර් 450 ක් වෙනුවෙන් රු. 193500.00 ක මුදලක් ද හංස බෝට්ටු සේවාව සඳහා උඩුකිරිවිල වැවේ ජලජ ශාක ඉවත් කිරීමේ කාර්යයෙහි නිරත වූ වීඩර් හාර්වස්ට් යන්ත්‍ර ක්‍රියාකරු සහ සහායක සඳහා දිවා ආහාරය ලබා දීම වෙනුවෙන් රු. 8500.00 ක මුදලක් ද ගෙවිය යුතුය.

ඒ අනුව මෙම සේවාව උඩුකිරිවිල වැව ආශ්‍රිතව ස්ථාපිත වන තුරු පවත්වාගෙන යාම වෙනුවෙන් වසර 03 පමණ කාලයක් සඳහා ව්‍යවසායකයාට ගිවිසුම්ගතව අවස්ථාව සලසා දීමත්, උඩුකිරිවිල වැවේ ජලජ ශාක ඉවත් කිරීමේ කාර්ය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන ලද වීඩර් හාර්වස්ට් යන්ත්‍රය සඳහා ලබාදුන් ඩීසල් ලීටර් 450 වෙනුවෙන් රු. 193500.00 ක් ද, හංස බෝට්ටු සේවාව සඳහා උඩුකිරිවිල වැවේ ජලජ ශාක ඉවත් කිරීමේ කාර්යයෙහි නිරත වූ වීඩර් හාර්වස්ට් යන්ත්‍ර ක්‍රියාකරු සහ සහායක සඳහා දිවා ආහාරය ලබා දීම වෙනුවෙන් රු. 8500.00 ක මුදලක් ද ගෙවීමත් සුදුසු බව ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමාගේ ස්තූති කතාව :-**

ගරු සභාපතිතුමා විසින් අද දින රැස්වීමට පැමිණි ගරු උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුලු කාර්යාලයේ නිලධාරී මණ්ඩලයටත්, මාධ්‍යවේදී මහතාටත්, සංග්‍රහ කිරීමට පැමිණි සියලු දෙනාටමත්, ස්තූතිය පුද කරමින් සභාවේ කටයුතු නිමා කරන ලදී.

විසිර යාම :-

පස්වරු 12.15 ට පමණ සභාවේ කටයුතු නිමාවූයෙන් සභා කොමෝ සතුටින් විසිර ගියහ.

2023.01.17 දින,
වීරකැටිය ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදීය.

ජයසේන ලියනආරච්චි
සභාපති
වීරකැටිය ප්‍රාදේශීය සභාව

ජයසේන ලියනආරච්චි
සභාපති
ප්‍රාදේශීය සභාව - වීරකැටිය

පිටපත් :-

1. පළාත් පාලන කොමසාරිස්තුමා
2. පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා
3. විගණන උප කාර්යාලය, හම්බන්තොට
4. මහජන පුස්තකාලය, වීරකැටිය